සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 9 - 2019

නම/විභාග අංකය :....................................... නාට්‍ය හා රංග කලාව කාලය: පැය 02යි.

**සැලකිය යුතුයි :**

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්ණයක් සඳහා ලකුණු දෙක බැගින් හිමිවේ.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

+ **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) නාට්‍ය පෙළක් යනුවෙන් අදහස් කරන්නේ,
1. සතර අභිනයම යුක්ත විය යුතු ය.
2. නිශ්චිත කාලසීමාවතක් තුළ සිදුකරන ක්‍රියාවලියකි.
3. අනුශාංගික අංගවලට අයත්වන්නකි.
4. සාහිත්‍යමය ලියවිල්ලකි.

(2) නාට්‍ය පෙළක දැක්ය හැකි ලක්ෂණයක් නොවන්නේ,
1. තේමාව උද්දීපනය වීම.
2. සමාජයට පණිවිඩයක් ලබාදීම.
3. නාට්‍යෝචිත අවස්ථා තිබීම.
4. කතාව මුල සිට අගටම විකාශනය වීම.

(3) ප්‍රකාශනාත්මක නිරූපණය කිරීමේදී අවධානය යොමු විය යුතු කරුණක් නොවන්නේ,
1. කාලය පිළිබඳව
2. ආරම්භය හා නිමාව පිළිබඳව
3. තාලය හා රිද්මය පිළිබඳව
4. ගැටුමක් අන්තර්ගත වීම

(4) ''කසල ගොඩක තිබුණත් මැණික වටී කවදත්'' යනුවෙන් අදහස් කරන්නේ.
1. කසල ගොඩවල්වල බොහෝ මැණික් ඇතිබව
2. මැණික් ඇති නිසා කසල ගොඩ වටිනා බව
3. කසල ගොඩක මැණික තිබිය යුතුබව
4. කසල ගොඩේ මැණික් තිබුණත් එහි වටිනා කමින් අඩුවක් නැති බවයි.

(5) චරිතයකට අදාල ලෙස නළුවාගේ ශරීරාංග සකස් කිරීම හඳුන්වන්නේ,
1. භාව ප්‍රකාශනය යන නමිනි
2. වේෂ භූෂණ නමිනි
3. අංග රචනය නමිනි.
4. සමාරෝපණය නමිනි.

+ **ප්‍රශ්න අංක 6 සිට 10 තෙක් ප්‍රශ්නවලට වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.**

| A | B |
|---|---|
| 1. කැළණී පාලම | වළල පෙට්ටිය |
| 2. තල මල පිපිලා | දුනු, හී , කඩුව |
| 3. මනමේ | පාලම, පැල්පත් |
| 4. කදා වළලු | නුග ගස, සම්මානය |
| 5. සිංහබාහු | |

(6) A වගුවේ ඇති නාට්‍යවලින් නාට්‍යධර්මී ශෛලියට අයත් නාට්‍ය වන්නේ,
1. කැළණි පාලම, මනමේ
2. කදා වළලු, තල මල පිපිලා
3. මනමේ, සිංහබාහු
4. තල මල පිපිලා, සිංහබාහු

(7) කදා වළලු හා මනමේ යන නාට්‍යවල අන්තර්ගත නාට්‍යෝපකරණ වන්නේ,

1. දුනු, හී, කඩු, වළලු, පෙට්ටිය
2 වළලු පෙට්ටිය, නුග ගස
3. පාලම, වළලු පෙට්ටිය
4. නුග ගස, දුනු හී.

(8) A වගුවේ ඇති නාට්‍ය අතරින් ලෝකධර්මී ශෛලියට අදාළ නාට්‍ය වන්නේ,

1. කැළණි පාලම, කදා වළලු
2. තල මල පිපිලා, මනමේ
3. කදා වළලු, සිංහබාහු
4. තල මල පිපිලා, කැළණි පාලම

(9) වේදිකා රංගනය වඩාත් අර්ථවත්ව හා සෞන්දර්යාත්මක කර ගැනීමට අවශ්‍ය වන අනුශාංගික ශිල්පය වන්නේ,

1. පසුතල නිර්මාණය
2. සංගීතය
3. රංගාලෝකය
4. රංග වස්ත්‍ර

(10) මුහුණේ උපාංග චලනයෙන් අදහස් ප්‍රකාශ කිරීම හඳුන්වනු ලබන්නේ

1. සාත්වික අභිනය යනුවෙනි
2 වාචික අභිනය යනුවෙනි
3. ආහාර්ය අභිනය යනුවෙනි
4. ආංගික අභිනය යනුවෙනි

+ **අංක 11 සිට අංක 15 දක්වා ප්‍රශ්නවලට පහත වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

| A | B | C | D | E |
|---|---|---|---|---|
| ඉඳහිට යන ගමන් මමත් මිනිහෙක් | වාසුල දත්තා චරිතය | සාර ගර්භගේ චරිතය හෙංචාගේ චරිතය | පිංගලගේ චරිතය | සුප්පා දේවිය දුර්ගාගේ චරිතය |

(11) A වගුවට අයත් නාට්‍ය නිෂ්පදනය කළ නාට්‍ය රචකයා වන්නේ,

1. මාක් ඇන්ටනී ප්‍රනාන්දු
2. නිශ්ශංක දිද්දෙණිය
3. එඩ්මන්ඩ් විජේසිංහ
4. සිරිල් වික්‍රමගේ

(12) B වගුවට අයත් හස්තිකාන්ත මන්තරේ නාට්‍යයේ එන චරිතයට රංගනය කළ නිළිය වන්නේ,

1. ට්‍රිලීෂියා ගුණවර්ධන
2. මාලනී රණසංහ
3. සෝමලතා සුභසංහ
4. චිත්‍රා වාකිස්ට

(13) C වගුවට අදාල ව චරිතවලට රංගනයෙන් දායක වූ නළුවා ලෙස හඳුන්වන්නේ,

1. නිශ්ශංක දිද්දෙනිය
2. එඩ්මන්ඩ් විජේසිංහ
3. සොලමන් ෆොන්සේකා
4. සිරිල් වික්‍රමගේ

(14) D අක්ෂරයට අදාල වගුවට අයත් චරිත නිරූපණයෙන් දායක වූ නළුවා වන්නේ,

1. නිශ්ශංක දිද්දෙණිය
2. සොලමන් ෆොන්සේකා
3. එඩ්මන්ඩ් විජේසිංහ
4. මාක් ඇන්ටනී ප්‍රනාන්දු

(15) E වගුවට අදාල නිරූපණයක යෙදුණු රංගන ශිල්පිනිය වන්නේ,

1. සෝමලතා සුබසිංහ
2. කෞෂල්‍යා ප්‍රනාන්දු
3. මාලණී රණසිංහ
4. ට්‍රිලීෂියා ගුණවර්ධන

+ **ප්‍රශ්න අංක 16 සිට 18 දක්වා ප්‍රශ්නවලට අදාල රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.**



අ



ආ



ඇ

(16) අ අක්ෂරයෙන් දැක්වෙන ශිල්පිනිය වන්නේ,
1. ට්‍රිලීෂියා ගුණවර්ධන
2. සෝමලතා සුබසිංහ
3. මිරැන්ඩා හේමලතා
4. කෞෂල්‍යා ප්‍රනාන්දු

(17) ආ අක්ෂරයෙන් දැක්වෙන නාට්‍ය නිර්මාණය කුමක් ද?
1. මනමේ
2. සිංහබාහු
3. රාජකපුරු
4. තල මල පිපිලා

(18) ඇ අක්ෂරයට අනුව දැක්වෙන රංග අභ්‍යාසය වන්නේ,
1. සංවේදන අභ්‍යාසයකි
2. ශිථිලකරණ අභ්‍යාසයකි
3. ස්වසන අභ්‍යාසයකි
4. කටහඬ අභ්‍යාසයකි

+ **අංක 19 සිට 20 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරන්න.**

(19) සගම, පස්ගම, අරත්තන යන නම් ඇතුළත් වන්නේ,
1. සකස් කඩ
2. බුද්ධ ගජ්ජය
3. නම්පොත
4. සන දෙවි හැල්ල

(20) පුද්ගලයෙකුගේ බාහිර ස්වරූපය වෙනත් අයුරකින් රචනා කිරීම,
1. ස්වාභාවික අංග රචනයයි.
2. ඍජු අංග රචනයයි.
3. චරිතාංග අංග රචනය
4. සාත්වික අංග රචනය

(ල. 2 × 20 = 40)

## II කොටස

+ **පළමු වන ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි.**
+ **පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 3 ක් සඳහා පිළිතුරු සපයන්න.**

(1) (i) කදා වළලු නාට්‍යයේ රචකයා නම් කරන්න. (ල. 2)
(ii) ''කච්චපුට' යන්න අර්ථ දක්වන්න. (ල. 2)
(iii) මෙම නාට්‍ය මුල්වරට වේදිකා ගතකළ වර්ෂය හා ස්ථානය නම් කරන්න (ල. 2)
(iv) මේ නාට්‍ය සඳහා පාදක වූ මූලාශ්‍ර කෘතිය කුමක් ද? (ල. 2)
(v) මෙම රචකයාගේ වෙනත් නාට්‍ය නිර්මාණ 2 ක් ලියන්න. (ල. 2)

(2) (i) සමාරෝපය යන්න අර්ථ දක්වන්න. (ල. 2)
(ii) සමාරෝපයේ ප්‍රභේද නම්කර ඉන් කැමති එකක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 3)
(iii) කදා වළලු නාට්‍යයේ චරිත 2 ක් නම් කර ඒවා සමාරෝපය වන ආකාරය පැහැදිලි කරන්න (ල. 5)

(3) (i) රංග අභ්‍යාස යන්න හඳුන්වන්න (ල. 2)
(ii) ඔබ උගත් රංග අභ්‍යාස 4 ක් නම් කරන්න. (ල. 3)
(iii) රංග අභ්‍යාසවල යෙදීමෙන් නළුවාට ඇතිවන ප්‍රයෝජන මොනවාද? (ල. 5)

(4) (i) ගැටුමක් යනු කුමක්ද? (ල. 2)
(ii) ගැටුමේ ප්‍රභේද 2 ක් නම් කරන්න (ල. 3)
(iii) කදා වළලු නාට්‍යයේ ප්‍රධාන ගැටුම් අවස්ථාවක් තෝරාගෙන නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ල. 5)

(5) (i) අනුෂාංගික අංග යනු කුමක්ද? (ල. 2)
(ii) අනුෂාංගික අංග 4 ක් නම් කරන්න. (ල. 3)
(iii) ඔබ නැරඹූ නාට්‍යයක අනුෂාංගික අංග භාවිතා කර ඇති ආකාරය නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ල. 5)

+ **පහත දී ඇති සිදුවීම පාදක කරගෙන නාට්‍යයකට සුදුසු පෙළ රචනයක් කරන්න.**

(6) වැව් ඉවුරේ දෙවට දිගේ සඳලතා පාසලට එන්නේ ඉතාමත් සතුටිනි. එහි ඇති වැටකෙයා පඳුරෙහි ඇති මල් කඩාගෙන යාම ඇගේ දෛනික පුරුද්දකි. දිනක් ඇය සුපුරුදු පරිදි වැටකෙයා මල් කැඩීමට අත දිගු කරන විට ...........................

(i) සංවාද සහිත රංග විධානවලින් යුත් පෙළ රචනයට (ල. 3)
(ii) ගැටුම් අවස්ථා නිර්මාණයට (ල. 3)
(iii) දෙගිඩියාව, කුතුහලය, නාට්‍යෝචිත අවස්ථා නිර්මාණයට (ල. 4)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 9 - 2019

### නාට්‍ය හා රංග කලාව - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | 4 | (6) | - 3 | (11) | 1 | (16) | - 2 |
| (2) | 4 | (7) | - 1 | (12) | 1 | (17) | - 2 |
| (3) | 4 | (8) | - 4 | (13) | 3 | (18) | - 3 |
| (4) | 4 | (9) | - 3 | (14) | 1 | (19) | - 3 |
| (5) | 3 | (10) | - 1 | (15) | 3 | (20) | - 3 |

### II කොටස

(1) (i) එදිරිවීර සරත්චන්ද්‍ර මහතා

(ii) කිහිල්ලේ පසුම්බිය සඟවාගෙන වෙළඳාමේ යන

(iii) 1958. 09. 06 දින බොරැල්ලේ තරුණ බෞද්ධ සමිති ශාලාව (ල. 2)

(iv) සේරිවාණිජ ජාතකය

(v) මහාසාර, මනමේ, සිංහබාහු

(ල. 2)

(2) (i) නළුවා හෝ නිළිය තම පෞද්ගලිකත්වයෙන් මිදී වෙනත් චරිතයකට ප්‍රවිෂ්ඨ වීමයි. (2)

(ii) අභ්‍යන්තර සමාරෝපණය ,

බාහිර සමාරෝපණය (3)

(iii) මේවායින් ශිෂ්‍යයා කැමති එකක් පිළිබඳ විග්‍රහකර ඇත්නම් ලකුණු දෙන්න (5)

(3) (i) නළුවා හෝ නිළියගේ ශාරීරික හා මානසික සමබරතාවය ඇති කරගැනීමට ප්‍රායෝගිකව කරනු ලබන අභ්‍යාස වේ.

(ii) ස්වසන අභ්‍යාස

තාපන අභ්‍යාස

සංවේදන අභ්‍යාස

ශිථිලකරණ අභ්‍යාස

කටහඬ අභ්‍යාස

(iii) ශාරීරික හා මානසික සමබරබව රැකගැනීම

නිර්මාණාත්මක ක්‍රියාකාරකම් කිරීමේ හැකියාව

සබකෝලය නැතිකර ගැනීම

සාමූහිකත්වය හුරු වීම

පරිකල්පනය

පෞරුෂ වර්ධනය

**Answer**

(4) (i) ගැටුමක් යනු ප්‍රතිවිරුද්ධ බලවේග දෙකක් (චරිත දෙකක්) අතර ඇතිවන වචන හුවමාරුවකි.

(ii) මිනිසා මිනිසා අතර

මිනිසා හා මනස අතර

මිනිසා හා සමාජය අතර

(iii) කදා වළලු නාට්‍යයට අනුව නිදසුන් ගෙන පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.

(5) (i) අනුශාංගික අංග යනු නාට්‍යයක් ලස්සන කර ගැනීම සඳහා පිටතින් එකතු කර ගන්නා දේය.

(ii) අංග රචනය, රංග වස්ත්‍ර, පසුතල, සංගීතය

(iii) ශිෂ්‍යයා නරඹා ඇති නාට්‍යයක් මගින් නිදසුන් සපයා ඇත්නම් ලකුණු ලබාදෙන්න.

(6) (i) සංවාද සහිත රංගවිධානවලින් යුක්ත වීම

(ii) ගැටුම් අවස්ථා නිර්මාණය (3)

(iii) දෙගිඩියාව, කුතුහලය, නාට්‍යෝචිත අවස්ථා නිර්මාණයට ලකුණු ලබාදෙන්න. (5)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 9 - 2019

### නාට්‍ය හා රංග කලාව - ප්‍රායෝගික පරීක්ෂණය

(1) ඔබ කැමති නාට්‍ය ගීතයක් ගායනය සමඟ නිරූපණය කරන්න. (ලකුණු 10)

(2) ලෝක ධර්ම නාට්‍යයක සංවාදයක් ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

(3) නාට්‍යධර්මී නාට්‍යයක සංවාදයක් ඉදිරිපත් කරන්න (ලකුණු 10)

(4) කතාන්තරයක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

(5) ගුරුවරයාගේ අභිමතය මත ක්ෂණික නිරූපණයක් සිසුනට ලබාදෙන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 50)